http://www.lankaenews.com/Sinhala/news.php?id=8321

# ක්‍රිකට් විකාශණ අයිතියට එරෙහිව අල්ලස් කොමිසමට පැමිණිල්ලක්



අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කිරීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින්

(ලංකා ඊ නිව්ස් -2009, මාර්තු.18, ප.ව.3.45) ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පසුගියදා පැවැති එක්දින ක්‍රිකට් තරඟ 05 හේ විකාශන අයිතිය ලබා ගැනීම සඳහා සිංගප්පූරුවේ නිම්බස් ටීවී ආයතනය සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අමාත්‍යංශය අතර අත්සන් කළ ගිවිසුම මගින් අක්‍රමිකතාවයක් සිදුවී ඇතැයි 'දූෂණ විමසුම' මගින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට අද (18) පෙරවරුවේ පැමිණිල්ලක් කළේය.

හිටපු ටෙස්ට් ක්‍රිකට් නායක හෂාන් තිලකරත්න සහ නීතිඥ ශිරාල් ලක්තිලක යන මහත්වරු දූෂණ විමර්ශන විමසුම වෙනුවෙන් මෙම පැමිණිල්ල කළහ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවැති එක්දින තරඟ 05 හේ විකාශන අයිතිය ලබා ගැනීම සඳහා නිම්බස් ටීවී ආයතනය ඩොලර් මිලියන 10 ක් හෝ ඊට වැඩි ගණනකට මිල ගණන් කැඳවීම ගැන මුලදී කැමැත්ත පල කර පසු ඩොලර් මිලියන 75 කට නිම්බස් ආයතනය එකඟ වී ඇති බවත්, එම ආයතනය ඩොලර් මිලියන 7.5 කට එකඟ වී තිබියදී ක්‍රීඩා අමාත්‍යංශය ඩොලර් මිලියන 6.5 කට එම ගිවිසුම අත්සන් කිරීම පිටුපස බරපතල අක්‍රමිකතාවයක් සිදුවී තිබෙන බවට තමන් විශ්වාස කරන බවත් හෂාන් තිලකරත්න මහතා කීවේය.